# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1499/20 – 2007 මැයි 30 වැනි බදාදා – 2007.05.30

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ජනාධිපතිතුමා විසින් කරනු ලබන ප්‍රකාශන ආදිය

ජනාධිපති විධානය

මුද්‍රාව

මහින්ද රාජපක්ෂ,

රාජ්‍ය අංශයෙහි පරිපාලන ප්‍රතිසංස්කරණ වැඩසටහනක් සම්පාදනය කිරීම සහ එය ක්‍රියාවට නැංවීමේ කටයුතු මෙහෙයැවීම පිණිස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමන් විසින් එකී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වැනි ව්‍යවස්ථාවෙන් තමා වෙත පැවරී ඇති බලතල ක්‍රියාවෙහි යොදවමින්, විශේෂ නියෝජිතායතනයක් ස්ථාපනය කරලීම

1. ජනාධිපති ලේකම්
2. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහුගේ නියෝජිතයා වශයෙන් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයෙකු
3. රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්
4. පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම්
5. ලයනල් ප්‍රනාන්දු මැතිතුමා, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ සම සභාපති
6. සභාපති, ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය
7. ධර්මසේන විජේසිංහ මැතිතුමා
8. ලොයිඩ් ප්‍රනාන්දු මැතිතුමා
9. ගුණපාල නානායක්කාර මැතිතුමා
10. ධම්මික අමරසිංහ මැතිතුමා
11. දීපාල් සූරියආරච්චි මැතිතුමා
12. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික පරිපාලන ප්‍රතිසංස්කරණ සභාව
13. මහින්ද බන්දුසේන මැතිතුමා

වෙතය,

*ශුභාශිංසන පෙරටුවයි. !*

පරිපාලන යාන්ත්‍රනය, රාජ්‍ය සේවාවන් ඉටුකරලීමේත්, සමාජ හා ආර්ථික සංවර්ධන වැඩසටහන් සම්පාදනය කොට ක්‍රියාවට නැංවීමේ සහ ජාතික සංවර්ධනයට සමාජයේ සෙසු අංශයන්හි හා ආර්ථිකයෙහි දායකත්වය සැලසීම පහසුකරලීමේත් සඵලදායි හා කාර්යක්ෂම මෙවලමක් වනු පිණිස එකී පරිපාලන යන්ත්‍රය නවීකරණය කොට ප්‍රශස්ථ මට්ටමකට ගෙන ඒමට රජය අපේක්ෂා කරන හෙයින් ද,

තවද, පූර්වෝක්ත කර්තව්‍යයට අදාළ කාර්යයන්, සිය පොදු මෙහෙයවීම යටතේ ඉටුකරලීම සඳහා සහ වඩා විශේෂ කොට දැක්වුවහොත්,

(i) රජයේ සමස්ත පරිපාලන හා කළමනාකරණ යාන්ත්‍රණය, අරමුණු කරා දිවෙන හා පිරිවැය ඵලදායි වන බව සාක්ෂාත් කරගනු පිණිස අවශ්‍ය විය හැකි යම් ප්‍රතිසංස්කරණ දියත් කරලීමේ අරමුණින් රාජ්‍ය අංශයෙහි පරිපාලන හා කළමනාකරණ ව්‍යුහයන් අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කිරීම.

(ii) රාජ්‍ය සේවයේ සියලු ස්ථරයන් හි සේවයෙහි නිරත සේවක පිරිස්වල ගුණාත්මක තත්ත්වය උසස් කරලීමේ අරමුණින් රාජ්‍ය මානව සම්පත් කළමනාකරණය හා මානව සම්පත් සංවර්ධනය අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කිරීම.

(iii) රාජ්‍ය සංවිධානයන්හි සේවා ක්‍රියාවලීන් අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කිරීම සහ අවශ්‍ය හා නිසි අවස්ථාවන්හි දී නවීන තාක්ෂණය භාවිතයට යොදා ගනිමින්, රජයේ කාර්යයන් කාර්යක්ෂම හා සඵලදායී ලෙසත් ජනතා හිතවාදීවත් ඉටුකෙරෙන බව සාක්ෂාත් කරගනු පිණිස අවශ්‍ය වෙනස්කම් හඳුන්වාදීම.

(iv) පරිපාලනය හා කළමනාකරණය වැඩි දියුණු කරලීමේ සහ නවීකරණය කරලීමේ අරමුණට අදාළ විය හැකි රාජ්‍ය සංවිධානයන්හි යම් වෙනත් පැතිමාවන් පරීක්ෂා කිරීම.

(v) ඉහත I - IV දක්වා වූ කාර්යයන් අනුව අවශ්‍ය විය හැකි සියලුම ප්‍රතිසංස්කරණ ක්‍රියාමාර්ගයන් සම්පාදනය කිරීම සහ ඒවා සියලුම රාජ්‍ය සංවිධානයන් තුළ ක්‍රියාවට නැංවීමේ කටයුතු මෙහෙයැවීම.

(vi) එබඳු ක්‍රියාවට නැංවීම් පිළිබඳ ප්‍රගතිය නියාමනය කිරීම සහ වරින් වර රජයට වාර්තා කිරීම.

සඳහා ජාතික පරිපාලන ප්‍රතිසංස්කරණ සභාවක් (මෙහි මින්මතු “සභාව” යනුවෙන් හඳුන්වනු ලබන) ස්ථාපනය කරලීම රජයේ අපේක්ෂාව වන හෙයින් ද,

තවද, ව්‍යවස්ථාපිත පනතක් මගින් එබඳු සභාවක් ස්ථාපනය කරනු ලබන තෙක්, ඉහතින් හඳුනාගෙන ඇති පරිදි, එකී සභාවට පවරනු ලබන කාර්යයන් හා වගකීම් ඉටුකරලීම මහජන යහපත තකා වහාම ඇරඹිය යුතුයැයි මා අදහස් කරන හෙයින් ද,

ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර, පූර්වෝක්ත කාර්යයන් හා වගකීම් භාරගෙන ඉටුකරලනු පිණිස ජාතික පරිපාලන ප්‍රතිසංස්කරණ සභාව මෙයින් පිහිටුවමි.

තවද, ඔබගේ විචක්ෂණභාවය, සාමර්ථ්‍යය සහ විශ්වාසවන්තභාවය කෙරෙහි මහත්වූ භක්තිය හා විශ්වාසය තබමින් මෙමගින් පෙරකී,

1. ජනාධිපති ලේකම්
2. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහුගේ නියෝජිතයා වශයෙන් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයෙකු
3. රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්
4. පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම්
5. ලයනල් ප්‍රනාන්දු මැතිතුමා, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ සම සභාපති
6. සභාපති, ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය
7. ධර්මසේන විජේසිංහ මැතිතුමා
8. ලොයිඩ් ප්‍රනාන්දු මැතිතුමා

9. ගුණපාල නානායක්කාර මැතිතුමා
10. ධම්මික අමරසිංහ මැතිතුමා
11. දීපාල් සූරියආරච්චි මැතිතුමා
12. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික පරිපාලන ප්‍රතිසංස්කරණ සභාව
13. මහින්ද බන්දුසේන මැතිතුමා.

වන ඔබ ජාතික පරිපාලන ප්‍රතිසංස්කරණ සභාවේ සාමාජිකයින් වශයෙන් මවිසින් මෙයින් පත්කරනු ලබන අතර ඉහත (I) සිට (VI) දක්වා වන කර්තව්‍යයන් ක්‍රියාවට නංවාලනු පිණිස අවශ්‍ය විය හැකි සියලුම පියවර ගන්නා මෙන් ඔබට මම මෙයින් විධාන කරමි.

තවද, ජනාධිපති ලේකම්වරයා ජාතික පරිපාලන ප්‍රතිසංස්කරණ සභාවේ සභාපතිවරයා ලෙසිනුත් ජාතික පරිපාලන ප්‍රතිසංස්කරණ සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා මේ සභාවේ ලේකම් ලෙසිනුත් මම තවදුරටත් මෙයින් පත්කරමි.

තවද, මෙයින් පවරනු ලබන කර්තව්‍යයන් ඉටුකරලීමට අදාළව අවශ්‍ය විය හැකි පරිදි පරීක්ෂණ කිරීම සහ කරුණු විමර්ශනය කිරීම පිණිස උපදෙස් නිකුත් කිරීමට ජාතික පරිපාලන ප්‍රතිසංස්කරණ සභාව වෙත මම මෙයින් බලය පවරමි.

තවද, ජාතික පරිපාලන ප්‍රතිසංස්කරණ සභාව විසින් උපදෙස් නිකුත් කරනු ලැබිය හැකි නැතහොත් තොරතුරු ලබාගනු පිණිස සහාය ඉල්ලා සිටිය හැකි සියලුම රජයේ නිලධරයන් හා එබඳු සෙසු තැනැත්තන් විසින් එම කාර්යය සම්බන්ධයෙන් නිසි අයුරින් පිළිපැදිය හැකි එබඳු උපදෙස්වලට අනුකූලව ක්‍රියාකළ යුතුයැයි ද, ලබාදිය හැකි සියලුම සහාය සැලසිය යුතු යැයි ද, සැපයිය හැකි සියලුම තොරතුරු ලබාදිය යුතු යැයි ද මම මෙයින් සියලුම රජයේ නිලධරයන්ට සහ සෙසු තැනැත්තන්ට නියම කොට විධාන කරමි.

වර්ෂ දෙදහස් හතක් වූ මාර්තු මස 05 වැනි මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

ලලිත් වීරතුංග,
ජනාධිපති ලේකම්.

06–315

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.